

# කොළඹ ශාඛාවේ ගරු සභාපති අනුජ කාමන් වික්‍රමසිංහ මහතා ගේ පණිවිඩය

රාහුල විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා, ඉන් පසු උසස් අධ්‍යාපනය හෝ රැකියාව හෝ වෙනත් අවශ්‍යතාවන් හෝ නිසා, කොළඹ හා තදාසන්න පළාත්වල වෙසෙන, රාහුල ආදි සිසු පරපුර යලිත් වරක් රාහුල ධජය වටා එක් රැස් කරමින්, එදා ඔවුන් තුළ පැවති සහෝදරත්වයෙන් බැඳුණු 'රාහුලත්වය' දිගින් දිගටම පවත්වා ගැනීම අපේ ශාඛාවේ ප්‍රධානතම අරමුණ වෙයි. එම අරමුණ පෙරදැරි කර ගනිමින් වසර පණහකුත් එකකට පෙර - 1962 දි - මෙම ශාඛාව ආරම්භ කරන්නට පුරෝගාමි වූ අපේ ජ්‍යෙෂ්ඨ ආදි සිසු පිරිසට අප සෑම දෙනා ගේ ම ගෞරවය නො අඩු ව හිමිවනු ඇත.

දැන් අප සිටිනුයේ අප ශාඛාවේ දෙවන අඩ සිය වස ආරම්භයේ ය. ගෙවී ගිය යුගයේ දී ට වඩා, අප ඉදිරියේ දක්නට ඇති යුගයේ සමාජමය පරිසරය බෙහෙවින් ම වෙනස් වෙමින් පවතී. ගෝලියකරණය, ඒ අනුව පරිවර්තනය වන ශ්‍රී ලාංකීය ජන සමාජය, නව පන්නයේ රටාවන් හා විලාසිතා යනාදී මේ සියල්ල නිසා, මෙතෙක් පරපුරෙන් පරපුරට රැකගනු ලැබූ සංස්කෘතිය, සාරධර්ම හා හර පද්ධතීන්ට  අභියෝග එල්ලවනු දැකිය හැකි ය. එහෙත්, රුහුණට, දකුණට 'රාහුලත්වය'ට ආවේණික, අප හුරු පුරුදු කරගෙන තිබෙන විශිෂ්ට ආභාෂයන් එම අභියෝගවලට ගොදුරුවීම, අප විසින් වළක්වා ගත යුතු වෙයි. එය කළ හැකි එක් ක්‍රමයක් වශයෙන් මා දකිනුයේ, අප රාහුල ආදි සිසුන් ඒකරාශී ව, රාහුල සහෝදරත්වය තුළ පෙළ ගැසී, අපේ පවුල්ගත පරම්පරාවන් අතර, එම ආභාෂයන් ප්‍රවර්ධනය කිරීමයි. ඒ සඳහා අපගේ ආදි ශිෂ්‍ය ශාඛාව තෝතැන්නක් බව කිව යුතු ය.

අද තවමත් අප ශාඛාව ගැන නො දන්නා, නැතහොත් තවමත් එහි සාමාජිකත්වය ලබා නො මැති, රාහුල ආදි සිසුන් මහත් රාශියක් කොළඹ හා එහි අවට වෙසෙන බව පැහැදිළි ය. ඔවුන්ට අප ගැන දැන ගැනීමට මෙම වෙබ් අඩවිය මහත් සේ ප්‍රයෝජනවත්වනු ඇත. ඒ සෑම එක් එක් අයෙකුට ම අපගේ ශාඛාවට බැඳෙන ලෙස ආරාධනය කරනු කැමැත්තෙමි. එසේ බැඳී, ශාඛාවේ විවිධ ක්‍රියාකාරකම් වලට එකතු වනලෙස ඉල්ලා සිටිනු කැමැත්තෙමි. මෙම යුගයේ ඉදිරි වසරවල දී අප ශාඛාවට හා එහි එක් එක් කාර්ය සාධක අනුකමිටුවලට නායකත්වය ලබාදීමට සැරසෙන ලෙස ආරාධනය කරනු කැමැත්තෙමි.

අප රාහුල විද්‍යාලය, රාහුල ධජය හා රාහුල ආදි සිසු පරපුර දිනේ වා!

අනුජ කාමන් වික්‍රමසිංහ (දුරකථන අංකය : 077 773 8644)
සභාපති
රාහුල ආදිශිෂ්‍ය සංගමයේ කොළඹ ශාඛාව